# සමාජවාදය සහ ආගම

වත්මන් සමාජය ජනගහණයේ ඉතා කුඩා අල්පතරයක් විසින්, ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ පංතිය විසින් කම්කරු පංතියේ අධි බහුතරය සූරාකෑම මත සම්පූර්ණයෙන්ම පදනම් වී ඇත. එය වහල් සමාජයකි, මන්දයත්, මුළු මහත් ජීවිත කාලය තිස්සේම ධනපතීන් සඳහා වැඩකරන ''නිදහස්'' කම්කරුවන්ට ලාභය නිපදවන වහලුන්ට දිවිපෙවෙත යම්තම් රැකදීම සඳහාත්, ධනපති වහල් ක්‍රමය ආරක්ෂා කිරීම සහ සදාකාලික කිරීම සඳහාත් අවශ්‍ය මාධ්‍යයන්ට පමණක් කම්කරුවන් ''හිමිකම්'' කියන බැවිණි.

කම්කරුවන් ආර්ථික වශයෙන් පාගා දැමීම, දේශපාලනමය පාගා දැමීමක් සහ සමාජමය අවඥාවකද්, බහු ජනතාවගේ අධ්‍යාත්මික සහ සදාචාර ජීවිතය රළුකිරීමක් සහ අඳුරු කිරීමක්ද අනිවාර්ය ලෙස බිහිකරන අතර එය අවිච්ජින්නයට පත් කරවාලයි. තම ආර්ථික විමුක්තිය සඳහා සටන් කිරීමට, අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් දේශපාලන නිදහසක් කම්කරුවන් ලබා ගනු ඇත. එහෙත් කොතෙකුත් නිදහස ලැබුණත් ධනපති ක්‍රමය පෙරළා දමන තුරු පවතින දුගී දුප්පත්කම, විරැකියාව සහ පෑගීම දුරුකරලීමට නොපුළුවන. හැමතැනම ජනතාවගේ පුළුල් කොටස් මත ඉමහත් බරක් පටවන ආගම අධ්‍යාත්මික පෑගීමේ එක් ආකාරයක් වන්නේය. මේ පුළුල් කොටස් සඳහටම අනුන්ට වැඩකිරීම, අවශ්‍යතාවය සහ හුදෙකලාබව නිසා මහත් වූ පීඩාවකට හසුවී සිටිති. සූරාකන්නන්ට විරුද්ධව ගෙන යන අරගලයේදී ඇතිවන බෙලහීනත්වය විසින්, මරණයෙන් පසු ඇතිවන වඩාත් හොඳ ජීවිතයක් පිළිබඳ විශ්වාසයක් අනිවාර්ය ලෙස බිහිකරන්නේ, මිලේච්ඡයින් ස්වභාව ධර්මයට විරුද්ධව කළ සටවේදී ඇතිවූ බෙලහීනත්වය විසින් දෙවියන්, යකුන් සහ හාස්කම් ආදිය බිහිකලාක් මෙනි. මුළු මහත් ජීවිත කාලය තිස්සේම වැඩ කරමින් සහ අග හිඟ කම්වලින්, මිරිකෙමින් මිහිපිට ජීවත්වන තුරු, යටත් පහත් කමින් සහ ඉවසීමෙන් දිවි ගෙවිය යුතු බවත්, ඒ වෙනුවට දෙව්ලොව ලැබෙන දිව්‍ය සම්පත් පිළිබඳ බලාපොරොත්තුවෙන් සැනසුම ලැබිය යුතු බවත් ආගම උගන්වයි. එහෙත් අනුන්ගේ ශ්‍රමය සූරාකමින් ජීවත්වන අය මිහිපිට ජීවත්වන කාලයේදී පිනට දිය යුතු බව ආගම උගන්වයි. මේ අනුව සූරාකන්නන්ගේ මුළු මහත් ජීවන පැවැත්ම සාධාරන යැයි කියන ඉතා පහත් ක්‍රමයක් පෙන්වන ආගම දිව්‍ය ලෝකයේ දිව්‍ය සම්පත් භුක්ති විඳීම සඳහා පහසු මිලකට බලපත්‍ර විකුණයි. ආගම මිනිසුන්ගේ අබිනිය. ප්‍රාග්ධනයේ වහලුන් විසින් තම මිනිස් ප්‍රතිරූපය ගිල්වා දමන, අඩු වැඩි වශයෙන් මිනිසෙකුට තරම් වන ජීවිතයක් සඳහා ඔවුන්ගේ ඉල්ලීම් ගිල්වා දමන ආගම වූකලී එක්තරා විදිහක අධ්‍යාත්මික මත්වීමක් වැන්න.

එහෙත් තම වහල් භාවය හඟින වහලා තම විමුක්තිය සඳහා සටන් කිරීමට නැගී සිටීම නිසාම ඔහුගේ වහල්භාවය අර්ධ වශයෙන් අහෝසි විය. මහා පරිමාණ කම්හල් කර්මාන්තය විසින් පුහුණුව ලැබූ, නාගරික අධ්‍යාපනයෙන් අධ්‍යයනය ලැබූ සමකාලීන පංති විඥාන කම්කරුවා අවඥා සහගත ලෙස ආගමික ප්‍රාග්විනිශ්චයන් බැහැර කරයි. ඔහු ආගම් පූජකයින්ට සහ ධනවාදී අවිචාර බුද්ධිමතුන්ට භාරකොට, මෙලොවදීම තමාට වඩාත් හොඳ ජීවිතයක් දිනා ගැනීමට වෑයම් කරයි. ආගම නැමැති ධූම පටලයට විරුද්ධව සටන් කිරීම සඳහා විද්‍යාව ප්‍රයෝජනයට ගන්නා සමාජවාදයේ පැත්ත නිර්ධන පංතිය ගැනීමට පටන් ගෙන ඇත. වත්මන් කාලයේදීම මිහිපිට වඩාත් හොඳ ජීවිතයක් ලබාගැනීම සඳහා නිර්ධන පංතිය සමගි කරලීමෙන්, මරණයෙන් මතු ජීවිතයක් පිළිබඳව වූ විශ්වාසයෙන් ඔවුන් මුදවාලයි.

ආගම පෞද්ගලික කටයුත්තක් ලෙස ප්‍රකාශ කළ යුතුය. මෙම වචනවලින් සමාජවාදීහු සාමාන්‍යයෙන් ආගම කෙරෙහි තමන් දක්වන ආකල්පය ප්‍රකාශ කරති. එහෙත් මෙම වචවල තේරුම පිළිබඳ වැරදි හැඟීම් දුරුකරලීම පිණිස ඒවා නිවැරදි ලෙස විග්‍රහ කළ යුතුය. රජය අනුව පමණක් බලන විට ආගම පෞද්ගලික දෙයක් විය යුතු බව අපි ඉල්ලා සිටිමු. එහෙත් අපේ පක්ෂය අනුව බලන විට, ආගම කිසිසේත්ම පෞද්ගලික කටයුත්තක් නොවිය යුතුය. රජය ආගම කෙරෙහි කිසිඳු සැලකිල්ලක් නොදැක් විය යුතුය. රජයේ අධිකාරය සමග ආගමික සංගම්වලට කිසිදු සම්බන්ධකමක් තිබිය යුතු නැත. තමන් කැමති ආගමක් ඇදහීමට සෑම කෙනෙකුටම පූර්ණ නිදහස තිබිය යුතුය. නැතිනම් කිසිම ආගමක් නොඇදහීමට, එනම් රීතියක් වශයෙන් සෑම සමාජවාදියෙකුම මෙන් අදේවවාදියෙකු වීමටද පූර්ණ නිදහස තිබිය යුතුය. ආගමික විශ්වාසය අනුව රට වැසියන්ට වෙනස්කම් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය. නිල ලියවිලි වල රටවැසියන්ගේ ආගම පිළිබඳ තොරතුරු සටහන් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතුය. රාජ්‍යය දෙවස්ථාන වලට නඩත්තු මුදල් දීමද, දෙවස්ථාන සහ ආගමික සංගම්වලට ආධාර මුදල් දීමද නැවැත්විය යුතුය. සමාන මත දරන රටවැසියන්ගෙන් යුත්, රජයෙන් ස්වාධීන සමාගමයන් බවට මේවා පත්විය යුතුය. පල්ලිය රජයේ රදළ පැවැත්ම මත ජීවත් වූ, රුසියානු රට වැසියන් රජය පිළිගත් පල්ලියේ රදළ ආධිපත්‍යය යටතේ ජීවත් වූ, මධ්‍යකාලීන යුගයට අයත් අධර්ම මර්ධනාධිකරණ නීති (අදත් මේ නීති අපේ දණ්ඩ නීති සංග්‍රහයේ සහ ව්‍යවස්ථාවලද දක්නට ඇත) සහිත ලජ්ජා සහගත සහ ශාපලත් අතීතය අකාමකා දැමිය හැක්කේ මෙම ඉල්ලීම් පූර්ණ ලෙස ඉටු කර ලීමෙනි. මෙම අධර්ම මර්ධනාධිකාරී නීති අනුව මිනිසුන්ගේ විඥානය උල්ලංඝණය කරමින්, විවිධ ආගම් විශ්වාස කරන්නන්ට සහ අවිශ්වාස කරන්නන්ට දඬුවම් දී ඇත්තේය. රජය පිළිගත් ආගමික නිකාය නැමැති මත්ද්‍රව්‍ය පාවිච්චි කරමින් රජයේ උසස් තනතුරු සහ රජයේ ආදායම් බෙදා හැරීම මෙයට සම්බන්ධ කර ඇත. පල්ලිය සහ රජය, සමකාලීන රජයෙන් සහ සමකාලීන පල්ලියෙන් සම්පූර්ණයෙන්ම වෙන් කළ යුතුයයි සමාජවාදී නිර්ධන පංතිය ඉල්ලා සිටී.

දේශපාලන නිදහසේ අවශ්‍ය සංයුතියක් ලෙස මෙම ඉල්ලීම රුසියානු විප්ලවය විසින් ක්‍රියාවට යෙදවිය යුතුය. පොලිස් නිලධාරීන්ගෙන් පිරී පවතින රදළවාදී සවෛරී තන්ත්‍රයේ ඇති දුෂ්ඨ ක්‍රියා කලාපය නිසා පූජක තන්ත්‍රය තුළ පවා නොසන්සුන්තාවයක් සහ කෝපයක් හටගෙන තිබෙන බැවින්, මේ අනුව රුසියානු විප්ලවය විශේෂ වාසිදායක

තත්ත්වයක පවතී. රුසියානු ඕතොඩොක්ස් ක්‍රිස්තියානි නිකායේ පූජකවරුන් කෙතරම් දුගී වුවද, කෙතරම් මෝඩ වුවද, රුසියාවේ පැරණි මධ්‍යකාලීන ක්‍රමය බිඳ වැටීම නිසා ඇතිවූ ඉමහත් හඬ විසින් ඔවුහු පවා නැගී සිටිති. ඔවුහු පවා නිදහස ඉල්ලීමේ ව්‍යාපාරයට එකතුවෙති. නිලධාරිවාදී ක්‍රියාවලට සහ නිලවාදයට විරුද්ධවද, ''දෙවියන් වහන්සේගේ සේවකයින් මත'' පටවා ඇති පොලීසියට ඔත්තු සැපයීමේ රාජකාර්යයට විරුද්ධවද ඔවුහු නැගිට සිටිති. සමාජවාදීන් වන අපි මෙම ව්‍යාපාරයට ආධාර කළ යුතු වෙමු. පූජක තන්ත්‍රයේ සෘජු සහ අවංක සාමාජිකයින් සිය නිගමනය කරා ගෙනයමින්, නිදහස පිළිබඳ ඔවුන්ගේ වගකීම්වලට ඔවුන් ගරු කළ යුතු බව ඉල්ලා සිටිමින්, ආගම සහ පොලීසිය අතර ඇති සියලු සම්බන්ධකම් බිඳ දැමිය යුතු යැයි ඔවුන් විසින් තීරණාත්මක ලෙස ඉල්ලා සිටිය යුතු බව ඔවුන්ට දන්වමින් අප ක්‍රියා කළ යුතුය. නුඹලා අවංක නම්, පල්ලියෙන් රජයද, පාසලින් පල්ලියද වෙන් කර ලීම සඳහාත් ආගම සම්පූර්ණයෙන්ම සහ නිරපේක්ෂ වශයෙන් පෞද්ගලික කටයුත්තක් ලෙස ප්‍රකාශ කර ලීම සඳහාත්, ක්‍රියා කළ යුත්තාහ. නැතිනම් නුඹලා නිදහස සඳහා කරන මේ ස්ථිර ඉල්ලීම් නොපිළිගනිති. එසේනම් නුඹලා අධර්ම මර්ධනාධිකරණයේ සම්ප්‍රදායන්වල සිරකරුවන් ලෙස තවමත් ජීවත් වෙති. එසේ නම් නුඹලා තවමත් සැප පහසුකම් ඇති ආණ්ඩුවේ රක්ෂාවල් බදාගෙන සිටිති, ආණ්ඩුවෙන් ලැබෙන ආදායම් භුක්ති විඳිති, එසේනම් නුඹලා, සිය අධ්‍යාත්මික අවියේ බලය ගැන විශ්වාස නොතබා දිගින් දිගටම රජයෙන් අල්ලස් ලබා ගනිති. තත්ත්වය මෙසේ වන්නේ නම්, මුළු මහත් රුසියාවේ පංති විඥාත කම්කරුවෝ නුඹලාට විරුද්ධව අනුකම්පා විරහිත ලෙස යුද්ධ ප්‍රකාශ කරති.

එහෙත් නිර්ධන පංතියේ සමාජවාදී පක්ෂයට නම්, ආගම පෞද්ගලික කටයුත්තක් නොවේ. අපේ පක්ෂය කම්කරු පංතියේ විමුක්තිය සඳහා සටන් කරන දියුණු සටන් කාමීන්ගේ පංති විඥාත සංවිධානයකි. එවැනි සංවිධානයක් ආගමික විශ්වාසවල හැඩයක් ගන්නා, පංති අවිඥාතභාවය, අමනකම හෝ ඥාන ශූන්‍යතාවය කෙරෙහි උදාසීනත්වයක් නොදැක්විය හැකි සහ නොදැක්විය යුතුය. අපේ පුවත්පත් මගින් හා කට වචනයෙන්, පිරිසිදු දෘෂ්ඨිමය සහ හුදු දෘෂ්ඨිමය අබිං මගින් ආගම නැමැති ධූම පටලයට විරුද්ධව සටන් කළ හැකිවන සේ, රජයෙන් පල්ලිය වෙන් කළ යුතු බව අපි තරයේම ඉල්ලමු. අප අපේ සංවිධානය වන රුසියානු සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය (රු.ස.ප්‍ර.ක.ප.) බිහි කළේ ආගම මුල් කරගෙන කම්කරුවන් අඳුරෙහි තැබීමට විරුද්ධව නිශ්චිත ලෙසම සටන් කිරීම සඳහාය. අපට නම් දෘෂ්ඨිමය අරගලය පෞද්ගලික කරුණක් නොවේ. එහෙත් එය මුළු මහත් පක්ෂයේම, මුළු මහත් නිර්ධන පංතියේම කාර්යයකි.

එසේ නම්, අපි අපේ වැඩ පිළිවෙල මගින් අදේවවාදීන් බව ප්‍රකාශ නොකරන්නේ මන්ද? ක්‍රිස්තු භක්තිකයින්ට සහ වෙනත් දෙවිවරුන් අදහන පුද්ගලයින්ට අප පක්ෂයට බැඳීම තහනම් නොකරන්නේ මන්ද?

මෙම ප්‍රශ්නයට සපයන පිළිතුර අනුව, ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් සහ සමාජ - ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ආගම ඉදිරිපත් කරන ආකාරයේ ඉතා වැදගත් වෙනස තේරුම් කෙරෙයි.

අපේ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම විද්‍යාත්මක අඩු වැඩි ද්‍රව්‍යවාදී ජගත් දෘෂ්ඨියක් මත පදනම් වී ඇත. එබැවින් අපේ වැඩ පිළිවෙල විස්තර කිරීම ආගම නැමැති ධූමිකාවේ සැබෑ ඓතිහාසික සහ ආර්ථික පදනම් විස්තර කිරීම අවශ්‍ය ලෙසම අයත් වෙයි. අපේ ප්‍රචාරය අවශ්‍යයෙන්ම අදේවවාදී ප්‍රචාරයන්ගෙන් යුක්ත වේ. ස්වෛරී තන්ත්‍රික ආණ්ඩුව විසින් මෙතෙක් දැඩිලෙස තහනම් කර ඇති සහ දඬුවම් පමුණුවන ලද, උචිත විද්‍යාත්මක සාහිත්‍ය කෘතීන් පළකිරීම, අප පක්ෂයේ වැඩවල එක් ක්ෂේත්‍රයක් විය යුතුය. වරක් එංගල්ස් ජර්මන් සමාජවාදීන්ට දුන් උපදෙස් දැන් අප විසින් අනුගමනය කළ යුතුය. දහඅටවෙනි සියවසේදී ප්‍රංශ බුද්ධිමතුන්ගේ සහ අනීශ්වරවාදීන්ගේ කෘතීන් පරිවර්තනය කොට පුළුල් ලෙස බෙදා හැරිය යුතුය.

එහෙත් කිසිම අවස්ථාවකදී හෝ ආගමික ප්‍රශ්නය හදු වියුක්ත, විඥානවාදී හැඩයකට, පංති සටන්වලට සම්බන්ධ නොවූ, 'බුද්ධිමය' ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කිරීමේ වරදට අප හසු නොවිය යුතුය. ධනපතීන් අතර සිටින රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදීහු මෙවැනි දෑ නිතර පාහේ කරති. ඉමක් නැති පෑගීම් සහ නින්දා අපහාසවලට කම්කරු පංතිය භාජනය කිරීම පදනම් වී ඇති සමාජයක ආගම පිළිබඳ අගතිගාමී හැඟීම්, හුදු ප්‍රචාරක ක්‍රමවලින් පමණක් දුරු කරලිය හැකියැයි සිතීම මෝඩ අදහසකි. මිනිස් සංහතිය මත පටවා ඇති ආගම නැමැති වියගහ සමාජය තුළ තිබෙන ආර්ථික වධ බන්දනය නැමැති විය ගහේම ප්‍රතිබිම්බයක් බව අමතක කිරීම ධනවාදී පටු බුද්ධියක් වනු ඇත. නිර්ධන පංතිය ධනවාදයේ පාපතර බලවේගයන්ට විරුද්ධව සටන් කොට, ආලෝකාවබෝධයක් ලබා ගෙන නැති නම්, කොතෙක් පොත් පිංචවල් මුද්‍රණය කළත්, කොතෙක් දේශනයන් කළත් එයට ආලෝකාවබෝධය ලබාගත නොහැකිය. මිහිපිට පාරාදීසයක් බිහිකිරීම සඳහා පෑගෙන පංතීන්ගේ මේ සැබෑ විප්ලවවාදී අරගලයේදී සමගිය ගොඩනැගීම, ස්වර්ගයේ පාරාදීසයක් පිළිබඳ නිර්ධන පංතික මතයේ එක්සත්කමට වඩා අපට වැදගත් වන්නේය.

අපේ අනීශ්වරවාදය පිළිබඳව අපේ වැඩපිළිවෙලින් අප නොදක්වන සහ නොදැක්විය යුතු හේතුව මෙයයි. පැරණි අගතිගාමීත්වයේ එක් හෝ තවත් නටබුන් ආරක්ෂා කරන නිර්ධන පංතියට අපේ පක්ෂය සමග සම්බන්ධවීම තහනම් නොකරන්නේත්, නොකළ යුත්තේත් මේ හේතුව නිසාය. අපි නිතරම විද්‍යාත්මක ජගත් දෘෂ්ඨිය දේශනා කරමු. කිතුනු බැතිමතුන්ගේ විවිධ කොටස්වලට අයත් අස්ථිරතාවයට විරුද්ධව සටන් කිරීමද අපට අවශ්‍ය වන්නේය. එහෙත් ආගමික ප්‍රශ්නයට මුල් තැන දිය යුතුයැයි මින් කොහෙත්ම අදහස් නොකෙරේ. ආගම පිළිබඳ ප්‍රශ්නය මුල් තැන ගෙන නැත. ඒ අතරම, ඉක්මණින්ම සියලු දේශපාලන වැදගත්කම් නැතිව යන, ආර්ථික සංවර්ධනයේ ක්‍රියාදාමය විසින් කහළ ගොඩට විසිකර දමන, පහත් ගණයේ මතයන් සහ තේරුමක් නැති අදහස් නිසා සැබෑ විප්ලවවාදී ආර්ථික සහ දේශපාලන අරගලයේ බලවේගයන් අතර භේදයක් ඇතිවීමට අප ඉඩ දිය යුතුයැයිද මින් අදහස් නොකෙරේ.

ආගම් භේදය පැතිර වීමට ලෝකයේ හැම රටකම ප්‍රතිගාමී ධනපති පංතිය ක්‍රියා කරන අතර දැන් රුසියාවේද එය පටන් ගෙන ඇත්තේ, විප්ලවවාදී අරගලයෙන් එක්සත් වෙමින් සිටින සමස්ත රුසියානු නිර්ධන පංතිය, විසින් ව්‍යවහාරික ලෙස විසඳන්නාවූ සැබවින්ම වැදගත් සහ මූලික ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලින් ජනතාවගේ සැලකිල්ල අන් අතකට යොමු කරවනු පිණිසය. කළු ශතකයේ ආගම් භේද ප්‍රචණ්ඩ ක්‍රියාවලින් අද ප්‍රකාශ වන නිර්ධන පංතික බලවේගයන් දෙකඩ කිරීමේ ප්‍රතිගාමී ප්‍රතිපත්තිය, හෙට වන විට වඩාත් සියුම් ආකාරයන් ගැනීමට ඉඩ ඇත. අපි සංසුන් ලෙසත්, ස්ථිර ලෙසත්, ඉවසිලි සහගත ලෙසත් නිර්ධන පංතික සහයෝගතාවය දේශනා කරමින් සහ විද්‍යාත්මක ජගත් දෘෂ්ඨිය දේශනා කරමින් එයට විරුද්ධ වමු. එම දේශනා ක්‍රමය නොවැදගත් භේදයන් ඇවිලවීමට සම්පූර්ණයෙන්ම විරුද්ධය.

රජය අනුව බලන විට, ආගම සැබවින්ම පෞද්ගලික දෙයක් කිරීමට විප්ලවවාදී නිර්ධන පංතිය සමත් වනු ඇත. මධ්‍යකාලීන යුගයේ පෙඳ පාසිවලින් පිරිසිදු කොට ගත් මේ දේශපාලන ක්‍රමය තුළ, මිනිස් සංහතිය ආගමික මංමුළාවකට ඇද දැමූ සැබෑ හේතුව වන ආර්ථික වහල්භාවය නැති කර ලීම සඳහා නිර්ධන පංතිය පුළුල් සහ විවෘත අරගලයක් ගෙනයනු ඇත.

''නෝවය ෂිස්න්'' අංක 28,
1905 දෙසැම්බර් 3.

වී. අයි. ලෙනින් සම්පූර්ණ කෘති,
වෙළුම 12,